| | |
|---|---|
| | **මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය** |
| | දෙවන වාර පරීක්ෂණය - 2025 |
| 11 **ශ්‍රේණිය** | **ශිල්ප කලා - II** |

නම/ විභාග අංකයඃ ........................................

✶ **පළමුවැනි ප්‍රශ්නය ද තෝරාගත් තවත් ප්‍රශ්න 4ක් ද ඇතුළුව ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.**

01) "දිරිය දෑතට සවිය" යන තේමාව යටතේ අධ්‍යාපන අමාත්‍යාංශය සහ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව එක්ව සංවිධානය කර ඇති වෙළඳ ප්‍රදර්ශනය සහ අත්කම් තරඟාවලිය 2025 දෙසැම්බර් 26 වන දින බත්තරමුල්ල අපේගම පියසේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇත.

i. මෙම ප්‍රදර්ශනයේ තේමා පාඨය ඇතුළත් ප්‍රචාරක දැන්වීමක ආකෘතියක් අඳින්න.

ii. ආරාධිත අමුත්තන්ට යැවීම සඳහා සුදුසු ආරාධනා පත්‍රයක ආකෘතිය ඇඳ දක්වන්න.

iii. දේශීය මල්, කොළ ආදිය භාවිතයෙන් සකස් කර ගත හැකි පොල්තෙල් පහනක දළ රූප සටහනක් අඳින්න.

iv. උත්සවයේ සංවිධායක මණ්ඩලයට පැළඳවීමට සුදුසු ලාංඡනයක් නිර්මාණය කරන්න.

v. ප්‍රදර්ශන භූමියේ ඉදිරිපස ඉදිකිරීමට සුදුසු තොරණක් ඇඳ දේශීය සැරසිලි මගින් අලංකාර කරන්න.

vi. නිවේදක පුවරුව අලංකාර කිරීමට සුදුසු සැරසිල්ලක් අඳින්න.

vii. අලෙවිකරණය සඳහා සුදුසු ජ්‍යාමිතික හැඩතල සහිතව සකස් කළ හැකි රෙදි කැබලි ආශ්‍රිත නිර්මාණ දෙකක් නම් කරන්න.

viii. ප්‍රදර්ශන කුටියේ තැබිය හැකි ආකාරයේ විසිතුරු මැටි භාණ්ඩ අලංකාර කිරීමට යොදා ගත හැකි අලංකරණ ක්‍රම දෙකක් නම් කරන්න.

ix. උත්සවයෙන් ලැබෙන ආදායමෙන් 12% ක් සංවිධාන කමිටුවේ වැඩ සඳහා ලැබෙයි. ආදායම රු.15000 වූයේ නම් සංවිධායක කමිටුවට ලැබෙන මුදල කීයද?

x. උත්සවයේ කෙටි ආහාර පිරිනැමීම සඳහා සුදුසු කාඩ්බෝඩ් ඇසුරුමක රූපීය පෙනුම ඇඳ දක්වන්න.

02) රෙදිපිළි අලංකරණය කර ගැනීම සඳහා විවිධ ක්‍රම භාවිතයේ ඇත.

i. සායම් භාවිතයෙන් තොරව රෙදිපිළි අලංකාර කර ගන්නා ක්‍රම දෙකක් නම් කරන්න.

ii. අච්චුවක් භාවිත කර මුද්‍රා තබා අලංකාර කිරීමේ දී වෙනත් මුද්‍රණ ක්‍රමවලින් නොලැබෙන වාසි ලබා ගැනීමේ හැකියාව ඇත. එවැනි වාසි දෙකක් දක්වා, අච්චු මුද්‍රණ ක්‍රමයට භාවිත කළ හැකි මෝස්තරයක් අඳින්න.

iii. සකස් කර ඇති තිර රාමුවක් භාවිත කර, කුෂන් කවරයක් අලංකාර කර ගන්නා ආකාරය කෙටියෙන් දක්වන්න.

03) වර්තමානයේ විවිධ අලංකරණ ක්‍රම මඟින් ද විශේෂිත සායම් වර්ග භාවිත කිරීම මඟින් ද රෙදිපිළි අලංකාර කරගැනේ.


i. අතින් පින්තාරු කිරීමේ දී වඩාත් හොඳ පින්සලක් තෝරා ගැනීම සඳහා සැලකිලිමත් විය යුතු කරුණු දෙකක් ලියන්න.

ii. සිඳුරු තහඩු මුද්‍රණය සඳහා සුදුසු මෝස්තරයක් අඳින්න.

iii. ඕනෑම පිළි අලංකරණ ක්‍රමයකින් අලංකාර කර ගත් නිර්මාණයක් සඳහා යෙදිය හැකි පසුපිරියම් ක්‍රමයක් නම් කර එය ක්‍රියාත්මක කරන ආකාරය විස්තර කරන්න.

04) අත් යන්ත්‍රයක ආධාරයෙන් තුවා රෙදි වියා ගැනීමේ අරමුණෙන් සකස් කළ නූල් හැදයක දළ රූප සටහනක් සහිත තොරතුරු පහත දක්වේ.

- හැදයේ දිග මීටර 100 කි.
- හැදයේ පළල සෙන්ටිමීටර 60 කි.
- එක් සෙන්ටිමීටරයක දික් නූල් පොටවල් ගණන 40 කි.
- නූලේ නොම්මරය $\frac{2}{40^s}$ කි.
- නූලේ වර්ණය සුදුය.




i. තුවා රෙදි විවීම සඳහා සුදුසු වියමන් රටා දෙකක් නම් කරන්න.

ii. ඉහත (i) හි නම් කරන ලද වියමන් රටා දෙකෙහි නූල් මතුවීම ප්‍රස්තාරගත කර දක්වන්න.

iii. හැදය සකස් කිරීමට අවශ්‍ය සුදු නූල් ප්‍රමාණය ගණනය කරන්න.

05) රෙදි නිෂ්පාදනයේ දී යොද ගන්නා යන්ත්‍ර ඒවායේ ක්‍රියාකාරිත්වය අනුව විවිධ වේ.

i. මහා පරිමාණ කර්මාන්තශාලාවල භාවිත වන බලවේග යන්ත්‍ර මගින් රෙදි විවීමේ වාසි දෙකක් ලියන්න.

ii. පුඩුවැල් පේළියක දළ රූප සටහනක් ඇඳ, එයින් කෙරෙන කාර්යයන් දක්වන්න.

iii. නූල් එතීමේ උපකරණ කට්ටලය නම් කර, එය භාවිත කරන ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

06) භූගත සම්පතක් වන මැටි නිධි වශයෙන් පොළොවේ තැන්පත්ව ඇති අතර ඒවා හාරා පිටතට ගෙන පදම් කොට භාණ්ඩ නිෂ්පාදනයට භාවිත කෙරේ.

i. මැටි පදම් කිරීමේ ක්‍රම කීයක් වේද? ඒ මොනවාද?

ii. පදම් මැටිවල තිබිය යුතු සුවිරිකාර්යතා ගුණය පැහැදිලි කරන්න.

iii. මැටි භාණ්ඩ පිළිස්සීමෙන් පසු සිදුවන වෙනස්කම් දෙකක් දක්වා එසේ වීමට හේතු පැහැදිලි කරන්න.

07) මැටි භාණ්ඩ අලංකරණය සඳහා පාරම්පරික ක්‍රම මෙන්ම නවීන ක්‍රම ද භාවිතයට පැමිණ ඇත.

i. හම් පදම් අවස්ථාවේ දී මැටි භාණ්ඩවලට යෙදිය හැකි අලංකරණ ක්‍රම දෙකක් නම් කරන්න.

ii. මැටි භාණ්ඩ අලංකාර කිරීමට භාවිත කෙරෙන නවීන අලංකරණ ක්‍රම දෙකක් දක්වා එයින් එක් ක්‍රමයකින් මැටි භාණ්ඩයක් අලංකාර කර ගන්නා ආකාරය පැහැදිලි කරන්න.

iii. උද්‍යාන අලංකරණයේ දී සැලකිලිමත් වියයුතු උද්‍යාන විද්‍යා මූලධර්ම දෙකක් නම්කර ඒවා පිළිබඳ කෙටි සටහන් ලියන්න.